# නිවනට හිණිමඟක් වන් මිහින්තලාව
# Mihintala - steps leading to Nirvana

This rocky citadel is an important place of pilgrimage for the Buddhists, who ascend the picturesque line of stone steps leading to the hallowed 'aradhana-gala' at the summit. These steps, numbering 1,084, so splendidly carved with great skill, indicate the work of superb constructional engineering. Seeing this line of steps a European once remarked " So wonderful to look at...., it appears as if leading to Heaven....".

Poson brings pleasant recollections of the heyday of Buddhism in **Anuradhapura**, Sri Lanka, the capital of Devanampiyatissa and in Pataliputra, the capital of Emperor Asoka. Asoka's son Mahinda had given up a promising career in the Royal court of his father and joined the Order of Bhikkhu Sangha. His father's brother had done the same. Asoka's daughter Sanghamitta had made a similar decision to join the Order of Bhikkhunis.

### Buddhist Art and Culture



Arahat Mahinda's arrival in Sri Lanka can be regarded as the beginning of Sinhala culture. He brought to Lanka not only a new religion but also a whole civilization then at the height of its glory. He introduced art and architecture into the island along with Sangharamas and Cetiyas. He can be regarded as the father of Sinhalese literature.

Arahat Mahinda brought to the island of the Sinhalese the commentaries of the Tripitaka and put them into Sinhalese for the benefit of the people of the Island. He thus made Sinhalese a literary language and inaugurated its literature.


Establishment of Buddhism in Sri Lanka influenced the development of Sinhala Culture and the Arts.

Historians agree totally that the acceptance by the people of Sri Lanka of Buddhism, with which the authentic history of the island begins, profoundly influenced the subsequent course of events therein and have imparted to its culture its distinctive character.

It is a fact that the foundation of Sinhala Culture was Buddhism. After Buddhism was established in Sri Lanka, it began to develop with the royal patronage provided for it. In a civilization based on Buddhism many changes took place.

Mihintalava, as time went on, developed into a sacred precinct, a complete Vihara consisting of Stupas, Uposathagharas, Bodhigharas, Patimagharas, surrounded by Avasas.

( Text - Courtesy - Sunday Observer)



**මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව කළ ස්ථානය වන මිහින්තලයේ අම්බස්තල පව්ව**
**The Ambastala Rock at Mihintale from where Arhat Mahinda preached the first Buddhist sermon in Sri Lanka.**

## සිංහල බෞද්ධ ශිෂ්ටාචාරයේ ජන්මභූමිය - මිහින්තලාව

**මි**හින්තලේ වන්දනාව ලාංකික බෞද්ධ සැදැහැවතුන්ට අතිශය වැදගත් කටයුත්තකි. චිත්තාකර්ෂණීය ලෙස නිර්මාණය කරඇති ගල් පඩිපෙළ නැගගෙන මුදුනටම ගොස්, පූජණීය ආරාධනා ගල මත නැගී හාත්පස බලන කෙනෙකුට නෙත දකින සෞන්දර්යය සමග මිහිඳු හාමුදුරුවන් එදා එතැනට වැඩ දෙවනපෑතිස් රජුට .තිස්ස තිස්ස. යයි ඇමතු හඬ එතන්හි ගුවනේ ඇසෙනවාට සැක නැත. මෙහි ගණනින් පඩි 1084 ක් වන අතර ඉතා සියුම් ලෙස ඒ හැම එකක්ම එකසේ නිර්මාණය කර තිබීම තුළින් පැරණි හෙළයාගේ නිර්මාණ නිපුණත්වය කෙබඳුදැයි ඉතා අගේට පැහැදිලි වේ. මෙම ගල් පඩි පෙළේ දර්ශණීයත්වය දුටු එක් යුරෝපීය ජාතිකයෙකු ප්‍රකාශ කළේ , " ඇත්තට දකින්නට පුදුම හිතෙනවා. පෙනෙන්නේ නම් මේ පඩිපෙළ දිගේ නිසැකවම මෝක්ෂයට යා හැකි බවයි." යන්නය.

පොසොන් අපට දේවානම්පියතිස්ස රජාණන් සමයේ අගනුවර වූ අනුරාධපුරයේත්, ඉන්දියාවේ අශෝක අධිරාජයා විසූ පාඨලීපුත්‍ර නගරයේත් එදා බුදුසමයේ අතිශය සමෘධිමත් සමය පිළිබඳ ප්‍රසන්න මතකයන් ගෙන එන්නේය. අශෝක රජ පුත් මහින්ද කුමරු රජපවුලක සැප සම්පත් සියල්ල අත්හැර සහ සසුනට එක්විය. ඔහුගේ පියාගේ සොහොයුරාද එසේ කළේය. නැගණිය සංඝමිත්තා කුමරිය ද භික්ෂුණී ශාසනයට ඇතුල් වූවා ය.

## බෞද්ධ සංස්කෘතිය හා කලාශිල්ප

මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකා ගමන සැබැවින්ම සිංහල සංස්කෘතියේ ආරම්භය ලෙස හැඳින්විය හැක. උන්වහන්සේ ලංකාවට අළුත් දහමක් ගෙනාවා පමණක් නොව ඒ සමග අති උත්කර්ෂවත් ශිෂ්ඨාචාරයක්ද අප රටට ගෙන ආවේය. මිහිඳු හිමියෝ භාරතයෙන් වඩුවන්, පෙදරේරුවන්, සිත්තරුන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, කැටයම්කරුවන්, මූර්ති ශිල්පීන්, චිත්‍රශිල්පීන් ආදී විවිධ විෂයයන්හි කෙළ පැමිණි පුද්ගලයින්ද ගෙන ආහ. එමගින් ලංකා ජනතාවට සිය සංස්කෘතියේ සැළැස්ම සකසා ගැන්මට අවශ්‍ය ගුරුහරුකම්, ධෛර්යය, තාක්ෂණය හා ප්‍රතිභාවද නොඅඩුව ලබනු හැකිවීය. එමග යමින් පසු කාලයක සිංහලයෝ සිත්කළු ගල්කැටයම්, දාගැබ්, පෙතිපිළිම නෙලමින්, සාගරය පරයන වැව් අමුණු බඳිමින් ලංකාව නම් කුඩා ද්වීපයේ විස්මිත දේ කළෝය.

එපමණක් ද නොව මිහිඳු හිමියෙ-ා් බුදුන්ගේ දහම අඩංගු ත්‍රිපිටකය සිංහල ජනතාවගේ ප්‍රයෝජනය උදෙසා සිංහලට හැරවූහ. සිංහලය මනරම් ගද්‍ය පද්‍යයෙන් අනූන අද්විතීය භාෂාවක් බවට පෙරළෙමින් සිංහල සාහිත්‍යයක් බිහිවූයේ ඉන් අනතුරුවය. මෙලෙස සිංහල බෞද්ධ සංස්කෘතියක් හා උසස් හැදියාවක් ශ්‍රීලංකාව තුළ බිහිකිරීමේ ගෞරවය හිමි වන්නේ මිහිඳු මහ රහතන් වහන්සේටය.

මහින්දා ගමනයෙන් පසු ශ්‍රීලංකාව තුළ ආගමික, සංස්කෘතික, සාමාජයික හා අධ්‍යාපනික වශයෙන් පෙරළියක් වූ බව ප්‍රකට කරුණකි. එහෙත් මහින්දාගමනයට පෙර යුගය ලංකාවේ නොදියුණු සංස්කෘතියක් තිබුණු යුගයක් යයි සැළකීම නුවණට හුරු නැත. මිහිඳු හිමියන් ඇතුළු ධර්මදූත පිරිස් දේශනා කළ භාෂාව තේරුම් ගන්නට හැකියාවක් හා බුදුදහමේ ගැඹුරු කොටස් වටහා ගන්නට තීක්ෂණ බුද්ධියක්ද ඔවුනට තිබුණි.

බුද්ධ ධර්මය ශ්‍රීලංකාවේ ජාතික සංකේතය බවට පත්වීමත් සමග සිංහලයන් තුල පරිත්‍යාගිශීලීබව, ආගන්තුක සත්කාරය, පරෝපකාරය, ඉවසීම, දයාව වැනි උතුම් ගුණාංග පෝෂණය වී පන්සිල් මුල්කරගත් චර්යා පද්ධතියක් ඇතිවූයේය. සතුන් මැරීම, සොරකම් කිරීම, කාම මිත්‍යාචාරය, මුසාවාදය හා මත්පැන් පානය හෙළා දකින යහපත් මනුෂ්‍ය සමාජයක ගති ලක්ෂණ පහල වන්නට විය. සතර පෝයට සිල්සමාදන්වීම, පන්සිල් ගෙන සියළු කටයුතු ආරම්භකිරීම, පිරිත් සජ්ජායනය හා වෙසක්, පොසොන්, දළදා පෙරහැර වැනි උත්සව පැවැත්වීමත් ලංකාවට පුරුදුවූයේ මහින්දාගමනයේ ප්‍රථිඵලයක් වශයෙනි.

♦ වෙනුර

Duke's Court Travel
DUKE'S COURT TRAVEL
Fly to Colombo
SriLankan Airlines fr £260 + Taxes + 10,000 Air Miles
Qatar Airways fr £245 + Taxes
Kuwait Airways fr £219 + Taxes
Emirates fr £430 + Taxes
Etihad Airways fr £245 + Taxes
Oman Air fr £163 + Taxes
Note: All fares mentioned are low season / terms & conditions apply.
020 8748 3535
AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS IATA
204 King Street, London W6 0RA

ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න
Transfer Fees From only £5



FAST CASH
SEND TODAY - COLLECT TODAY
* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය
COMMERCIAL BANK BOC BANK OF CEYLON HNB HSBC සම්පත් බැංකුව SampathBank PEOPLE'S BANK Standard Chartered
Strong. Safe. Reliable. MCG Mike Cooke Group දින 7ම විවෘතයි
www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT